
# 6 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ )




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

www.nie.lk

# 6 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු අත්පොත

(2015 සිට ක්‍රියාත්මක වේ )

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# බුද්ධ ධර්මය
## ගුරු මාර්ගෝපදේශය
## 6 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: .......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
කථිකාචාර්ය, එස්. පී. විතාන මහතා

**විෂය කමිටුව** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක හිමිපාණෝ
සබරගමුව පළාත් බුද්ධ ධර්මය විෂය අධ්‍යක්ෂ පූජ්‍ය මාවෙල සුමන හිමිපාණෝ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා
කෑගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක ඩබ්.ජී.සී. වේරගොඩ මහත්මිය
ගා/අහංගම රෝහණ මහා විද්‍යාලයේ ආචාරිනී කේ.එස්. චන්ද්‍රානි මහත්මිය
මාලබේ, ආදර්ශ (පිරිමි) මහා විද්‍යාලයේ ආචාර්ය එස්.එම්.එන්.ගයා කාන්ත මහතා

**ලේඛක මණ්ඩලය** :

කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනයේ
කථිකාචාර්ය, පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
මාලබේ, යසෝදරා මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කවිසිගමුව මහත්මිය
කිරිල්ලවල මධ්‍ය විද්‍යාලයේ ආචාරිනී කේ. කේ. එස්. නිරෝෂණී වික්‍රමාරච්චි මහත්මිය

**විෂය සංස්කරණය** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක හිමිපාණෝ

**භාෂා සංස්කරණය** :

සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන් සැකසුම** :

මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හද හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු ද සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ. ඒ සඳහා

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදු මැදුර, රුක් සෙවනක් ආදි) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව  සිදු කළ යුතු අතර හැකියා නො හැකියා අනුව  ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල  කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු  ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව ඇගයීම් සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන්  යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කරන්නට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල්  සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරු භවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය, එස්. පී. විතාන**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
| --- | --- |


| | |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | i |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| විවිධ සහාය | 47 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත් කරණයෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහිකිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීම මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත් විචාරශීලී මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහිකිරීමටත් විෂය නිර්දේශය මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කරගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබවින් ම දරුවා සක්‍රීය ඉගෙනුමක් කරා ගෙන යාමටත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහය හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදුදහමෙහි මූලික ඉගැන්වීම් උපයෝගි කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

(3) සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වණක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාදකොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍යය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(7) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැකගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | **6.1.1 සිදුහත් බෝසත් උපතේ මූලික සිදුවීම් ඇසුරෙන් තම ජීවිතය අර්ථවත් කර ගනියි.** | • දේවාරාධනාව සිට බෝසත් උපත තෙක් | • දේවාරාධනාව පිළිබඳ කරුණු පැහැදිලි කරයි.<br>• පුණ්‍යවන්තයකු ලොව උපදින විට අසිරිමත් දේ සිදුවන බව පිළිගනියි.<br>• දේවාරාධනාවේ සිට බෝසත් උපත දක්වා වැදගත් සිදුවීම් පෙළගස්වයි.<br>• තීරණ ගැනීමේ දී විමසිලිමත් වෙයි.<br>• මාතෘත්වය උදෙසා ගරු බුහුමන් දක්වයි. | 02 |
| | **6.1.2 සිදුහත් බෝසත් සිරිතෙන් ආදර්ශ ගෙන ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ක්‍රියා කරයි.** | • සිද්ධාර්ථ කුමාරෝත්පත්ති -යේ සිට ශිල්ප දැක්වීම තෙක් | • සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට ශිල්ප දැක්වීම තෙක් සිදුවීම් ගෙනහැර දක්වයි.<br>• සිදුහත් කුමාර චරිතයෙන් ආදර්ශ දැක්වෙන ලේඛනයක් පිළියෙල කරයි.<br>• ළමා වියේ සිට දක්ෂ ලෙස ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමෙන් ජීවිතය සාර්ථක කර ගත හැකි බව පිළිගනියි.<br>• තම සහජ දක්ෂතා මතුකර ගනිමින් ඉගෙනුමෙහි යෙදෙයි.<br>• අභියෝගාත්මක අවස්ථාවල දී ඒවා ජය ගැනීමට කටයුතු කරයි. | 02 |
| | **6.1.3 සිදුහත් බෝසත් සිරිතේ අභියෝග හඳාරා ජීවිත අභියෝග ජය ගැනීමට ක්‍රියා කරයි.** | • සිදුහත් බෝසත් කුමරුගේ විවාහයේ සිට බුද්ධත්වය තෙක් | • සිදුහත් බෝසත් චරිතයේ අභියෝග තිබූ බවට නිදසුන් සපයයි.<br>• සිදුහත් බෝසතාණෝ අනාගත දැක්මෙන් යුතු ව කටයුතු කළ බව පිළිගනියි.<br>• "අභියෝග ජය ගනිමු" මාතෘකාව යටතේ කථා පිටපතක් සකසයි.<br>• තීරණ ගැනීමේ දී විමර්ශනශීලී ව කටයුතු කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී නිවැරදි හා ඍජු තීරණ ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි. | 6.2.1 **අවබෝධයෙන් යුතු ව වන්දනාමාන හා වතාවත්වල යෙදෙයි.** | • දෛනික ජීවිතයේ දී අර්ථාන්විත ව ආගමික වතාවත්හි යෙදීම | • පන්සලට ගොස් වන්දනා කිරීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පැහැදිලි කරයි.<br>• බුද්ධ වන්දනය අර්ථාන්විත ව ගෞරවාන්විත ව කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>• වන්දනා කිරීමේ දී අනුගමනය කළ යුතු ආකාරය දැක්වෙන උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.<br>• දෛනික ව තෙරුවන වන්දනයේ යෙදෙයි.<br>• ක්‍රමානුකූල ව ආගමික කටයුතුවල යෙදෙයි. | 02 |
| | 6.2.2 **භාවනාවේ අවශ්‍යතාව තේරුම් ගෙන නිවැරදි ඉරියව්වෙන් භාවනාවට යොමු වෙයි.** | • මෛත්‍රී භාවනාව පිළිබඳ හැඳින්වීම | • මෛත්‍රී භාවනාව වඩන ආකාරය පැහැදිලි කරයි.<br>• මෛත්‍රී භාවනාවෙන් මිතුරු සිතුවිලි වැඩිවන බව පිළිගනියි.<br>• මෛත්‍රී භාවනාවේ නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.<br>• ඉවසීමෙන් කටයුතු කරයි.<br>• දෛනික කටයුතුවල දී සන්සුන් ව ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **6.2.3 තම ජීවිතය හැඩගසා ගැනීමට ශ්‍රාවක චරිත ආදර්ශයට ගනියි.** | • රාහුල පොඩි හාමුදුරුවෝ | • රාහුල හිමිගේ චරිතය පැහැදිලි කරයි.<br>• රාහුල හිමිගේ චරිත ලක්ෂණ හොඳ දරුවකු තුළ තිබිය යුතු බව පිළිගනියි.<br>• "යහපත් දරුවකු වන්නට නම්" මාතෘකාව යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.<br>• ගුරු දෙගුරුන්ට කීකරු වෙයි.<br>• වැඩිහිටි අවවාද පිළිගෙන ඒ අනුව කටයුතු කරයි. | 02 |
| | **6.2.4 ජාතක දේශනාවල සඳහන් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් ජීවන රටාව ගොඩනගා ගනියි.** | • අත්ථස්සද්වාර ජාතකය | • අත්තස්සද්වාර ජාතකයේ ඉගැන්වෙන දියුණුවේ දොරටු නම් කරයි.<br>• නිරෝගීකම මෙන් ම ගුණ නුවණ ද දියුණුව සඳහා අවශ්‍ය බව පෙන්වා දෙයි.<br>• "ආරෝග්‍ය මිච්ඡේ පරමං ච ලාභං" යන ගාථාව නිවැරදි ව සජ්ඣායනා කරයි.<br>• යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.<br>• ජාතක කථා කියවා ඒවායේ ආදර්ශ ජීවිතයට එකතු කර ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | **6.3.1 බුදු දහමේ ඉගැන්වෙන සීලය හැඳින සදාචාරාත්-මක ජීවිතයක් ගත කරයි.** | • සීලය පිළිබඳ සරල හැඳින්වීමක් | • බුදු දහමේ ඉගැන්වෙන සීලය කෙටියෙන් පැහැදිලි කරයි.<br>• ශිෂ්‍යයකු ලෙස කුඩා කල සිට ම සීලය ප්‍රගුණ කළ යුත්තක් බව පෙන්වා දෙයි.<br>• සිල්වත්වීමේ අගය දැක්වෙන කෙටි නාට්‍යයක් රඟ දක්වයි.<br>• අන්‍යයන්ට ආචාරශීලී වෙයි.<br>• කය, වචනයේ සංවර බව ප්‍රදර්ශනය කරයි. | 02 |
| | **6.3.2 පංච සීලය හැඳින පවින් වැළකී යහපත් ජීවිතයක් ගත කරයි.** | • පන්සිල් පිළිබඳ සරල හැඳින්වීමක් (පද්‍ය පන්තියකින්) | • සිල්පද පහ නිවැරදි ව අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම.<br>• පංචසීල ප්‍රතිපත්තියෙන් නිවැරදි දිවි පැවැත්මක් ඇති වන බව පිළිගනී.<br>• පන්සිල් රැකීමේ ආනිසංස වගුගත කරයි.<br>• පවින් වැළකී යහපතෙහි යෙදෙයි.<br>• අන්‍යෝන්‍ය ගරුත්වය කෙරෙහි සැලකිලිමත් ව කටයුතු කරයි. | 02 |
| | **6.3.3 මව්පිය ගුණ හැඳින තම යුතුකම් ඉටුකරයි.** | • බුදු දහමට අනුව මව්පිය ගුණ හැඳින යුතුකම් ඉටුකිරීම (සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් ) | • දෙමව්පියන් දරුවන්ට ඉටුකරන යුතුකම් පැහැදිලි කරයි.<br>• කුඩා කල තමාට පිහිට වූ දෙමව්පියන්ට අනාගතයේ දී කෘතගුණ දැක්විය යුතු බව පෙන්වා දෙයි.<br>• දෙමව්පිය අගය දැක්වෙන කවි නිර්මාණය කරයි.<br>• දිනපතා උදේ සවස දෙමාපියන් නමදියි.<br>• දෙමව්පියන්ට ගෞරවාන්විත ව කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | **6.4.1 වගකීම හා වගවීම තේරුම් ගෙන ඊට උචිත පරිදි තම චර්යාව හැඩගසා ගනියි.** | • මඝ මානවක ජාතක කථාව | • පෞරුෂය ගොඩනගා ගැනීම තමාගේ දියුණුවට හේතුවන ආකාරය විස්තර කරයි.<br>• තමාට ලැබෙන තනතුරු වගකීමෙන් හා වගවීමෙන් දැරිය යුතු බව පිළිගනී.<br>• මඝ මානවක ජාතකය රඟ දක්වයි.<br>• අභියෝග හමුවේ නොසැලී කටයුතු කරයි.<br>• කණ්ඩායමක සාමූහිකත්වයෙන් හා වගකීමෙන් යුතුව කටයුතු කරයි. | 02 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | **6.5.1 ශ්‍රී ලාංකිකයනට ආවේනික ජාතික සංකේත හැඳින ඒවා සුරකිමින් කටයුතු කරයි.** | • ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය | • ජාතික සංකේත ඇසුරින් ජාතියේ අනන්‍යතා ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ජාතික සංකේත භාවිතයේ දී එහි අභිමානය සුරැකෙන පරිදි කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ජාතික ගීය නිවැරදිව ගායනා කරයි.<br>• ජාතික කොඩිය හා ජාතික ගීය අනුමත අවස්ථාවල පමණක් භාවිත කරයි.<br>• ශ්‍රී ලාංකික ජාතිකාභිමානයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **6.6.1 හොඳ නරක පිළිබඳ බෞද්ධ නිර්ණායක හැඳින යහපතෙහි යෙදෙයි.** | හොඳ නරක පිළිබඳ සරල හැඳින්වීමක්<br>අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය සහ"තං ච කම්මං කතං සාධු " සහ"න තං කම්මං කතං සාධු" යන ගාථා දෙක ඇසුරින් | • හොඳ නරක සරල ව හඳුන්වයි.<br>• අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් යහපත් අයෙකු විය හැකි බව පිළිගනියි.<br>• ඔබට අනුගමනය කළ හැකි යහපත් සිරිත් ඇතුළත් ලේඛනයක් පිළියෙල කරයි.<br>• බෞද්ධ නිර්ණායක අනුව දෛනික ක්‍රියාවන්හි යෙදේ.<br>• යහපතෙහි හැසිරෙමින් ගුණ ගරුක ජීවිතයක් ගත කරයි. | 02 |
| | **6.6.2 අනිත්‍යතාව තේරුම් ගෙන වෙනස් වීම් හමුවේ නොසැලී කටයුතු කරයි.** | ලෝකයේ සියල්ල වෙනස් වන බව (අනිත්‍යතාව) පිළිබඳ සරල හැඳින්වීමක් | • ලෝකයේ සියල්ල වෙනස් වන බව නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• තමා ඇතුළු ලෝකයේ සිදුවන සියලු දේ එකම ආකාරයකින් නොපවතින බව පිළිගනී.<br>• වෙනස්වීම දැක්වෙන සරල කතා පුවතක් නිර්මාණය කරයි.<br>• තමා හමුවට පැමිණෙන ගැටලු විශ්ලේෂණය කොට විසඳුම් සොයයි.<br>• අනිත්‍යතාව හමුවේ අභියෝග ජය ගනිමින් නොසැලී කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීවි අජීවි පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | **6.7.1 තමා උපමා කොටගෙන සියලු ජීවීන් කෙරෙහි හිතානුකම්පී ව ක්‍රියා කරයි.** | "සබ්බේ තසන්ති දණ්ඩස්ස" යන ගාථා දෙකට අනුව කෙටි විවරණයක් | • අත්තූපනායික ධර්මය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• තම ජීවිතයට තමා මෙන් ම සියලු සත්වයන් ද සිය ජීවිතවලට ආදරය කරන බව පිළිගනියි.<br>• "සබ්බේ තසන්ති දණ්ඩස්ස" යන ධම්මපද ගාථා දෙක නිවැරදි ව සජ්ඣායනා කරයි.<br>• අන්‍යයන්ගේ සුබ සිද්ධියට කටයුතු කරයි.<br>• ජීව පරිසරයට හිතානුකම්පී වෙයි. | 02 |
| | **6.7.2 භෞතික පරිසරයේ වටිනාකම තේරුම් ගෙන පරිසර සංරක්ෂණයට දායක වෙයි.** | පරිසරය සංරක්ෂණය, පෝෂණය හා පරිසර දූෂණයෙන් වැළකීම. | • භෞතික පරිසරය මිනිසා හා බැඳී ඇති බව පැහැදිලි කරයි.<br>• පරිසරය රැක ගැනීම යුතුකමක් බව පිළිගනියි.<br>• පරිසරය සුරැකීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කරයි.<br>• පරිසර පවිත්‍රතාවට හුරු වෙයි.<br>• ගහකොළවලට ආදරය කරමින් ඒවා ආරක්ෂා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | **6.8.1 මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදු වීම් අගයමින් එම උරුමයන් රැක ගැනීමට කටයුතු කරයි.** | මහින්දාගමනය (මිහිඳු හිමියන් හා රජතුමා අතර සංවාදය) අනෙකුත් සුවිශේෂ සිදුවීම. | • මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදුවීම් පැහැදිලි කරයි.<br>• මහින්දාගමනයෙන් ලද ශාසනික දායාද රැකගත යුතු බව පිළිගනී.<br>• බෞද්ධ උරුමය යන මැයෙන් පද්‍ය නිර්මාණය කරයි.<br>• බෞද්ධ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරයි.<br>• බෞද්ධ සිරිත් විරිත්වලට අනුගත ව කටයුතු කරයි. | 02 |
| | **6.8.2 දුමින්දාගමනයෙන් ලත් දායාද අගයමින් ඒවා රැක ගැනීමට ක්‍රියා කරයි.** | සඟමිත් තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම. (දුමින්දාගමනය) | • සංඝමිත්තා තෙරණිය වැඩමවීමෙන් අප ලද දායාද පැහැදිලි කරයි.<br>• දුමින්දාගමනයෙන් මෙරට විවිධ ශිල්ප කලාවන්ගේ වර්ධනය සිදු වූ බව පිළිගනී.<br>• දුමින්දාගමනයෙන් ලත් දායාද යන මැයෙන් බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරයි.<br>• සංස්කෘතික අංගයන් රැක ගැනීමට කටයුතු කරයි.<br>• අන්‍යෝන්‍ය සුහදතාවෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | **6.9.1 සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි.** | අංගුත්තර නිකායේ කුල සූත්‍රයට අනුව හා ජීවක කථා වස්තුවේ සාකේත නුවර සිටුදේවියගේ කතා වස්තුව අනුව සම්පත් පරිහරණයේ වැදගත්කම පැහැදිලි කිරීම | • සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වයි.<br>• සම්පත් පරිහරණය සැලැස්මක් ඇතුව කළ යුතු බව පිළිගනී.<br>• සාකේත නුවර සිටුදේවියගේ කතා වස්තුව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.<br>• අධික පරිභෝජනයෙන් වැළකී සරල දිවි පෙවෙතකට හුරු වේ.<br>• සම්පත් මනාලෙස කළමනාකරණය කර ගැනීමට මව්පියන්ට සහාය වෙයි. | 02 |
| | **6.9.2 සම්පත් පරිභෝජනයේ දී දැඩි ලෝභය හානිකර බව පිළිගෙන ක්‍රියා කරයි.** | ස්වර්ණහංස ජාතකය | • දැඩි ලෝභය පසු තැවීමට හේතුවන ආකාරය විස්තර කරයි.<br>• සම්පත් රැක ගැනීම අපගේ වගකීමක් බව පිළිගනියි.<br>• "නිවැරදි ව සම්පත් පරිහරණය කරමු." යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් නිර්මාණය කරයි.<br>• උපයන සම්පත් සැලසුම් සහගත ව පරිහරණය කරයි.<br>• කෘතගුණ සැලකීමට හුරු වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | **6.10.11 බෞද්ධ ප්‍රතිපදාවේ එන ශ්‍රද්ධාව හා ශ්‍රද්ධාවන්ත යාගේ ලක්ෂණ හැඳින සැදැහැවත් ව කටයුතු කරයි.** | ශ්‍රද්ධාව පිළිබඳ ව සරල හැඳින්වීමක් හා "දස්සන කාමෝ සීලවතං" යන ගාථාව ඇසුරින් ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් | • ශ්‍රද්ධාවන්තයකු තුළ දකින්නට ලැබෙන ලක්ෂණ පැහැදිලි කරයි.<br>• බෞද්ධයකු වීමේ මූලික පදනම ශ්‍රද්ධාවෙන් ආරම්භ වන බව පිළිගනියි.<br>• පාසලේ ආගමික වතාවත්වල දී ශ්‍රද්ධාව ජනනය වන ආකාරය දක්වයි.<br>• එදිනෙදා ජීවිතයේ දී, ආගමික කටයුතුවල දී ශ්‍රද්ධාවෙන් යුතු ව කටයුතු කරයි.<br>• තුණුරුවන ඇසුරු කොට ගෙන ජීවිතය සාර්ථක කර ගනියි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01** : තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 6.1.1** : සිදුහත් බෝසත් උපතේ මූලික සිදුවීම් ඇසුරෙන් තම ජීවිතය අර්ථවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- දේවාරාධනාව පිළිබඳ කරුණු පැහැදිලි කරයි.
- පුණ්‍යවන්තයකු ලොව උපදින විට අසිරිමත් දේ සිදුවන බව පිළිගනියි.
- දේවාරාධනාවේ සිට බෝසත් උපත දක්වා වැදගත් සිදු වීම් පෙළගස්වයි.
- තීරණ ගැනීමේ දී විමසිලිමත් වෙයි.
- මාතෘත්වයට ගරු බුහුමන් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දේවාරාධනාවේ සිට සිදුහත් බෝසත් උපත තෙක් කරුණු සාකච්ඡා කිරීම මෙම පාඩමේ දී අපේක්ෂිත ය. එබැවින් පහත සඳහන් කරුණු පදනම් ව පාඩම සංවර්ධනය සැලසුම් කරන්න.

**පියවර 1** :

- මහාමායා දේවිය දුටු සිහිනය හා බෝසත් උපත දැක්වෙන චිත්‍රයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරමින් පෙර දැනුම සිහිපත් කරවමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මහාමායා දේවිය දුටු සිහිනයෙන් මහ බෝසතුන් මව් කුස පිළිසිඳ ගැනීම සංකේතවත් වීම පැහැදිලි කොට සිදුහත් බෝසත් චරිතයෙන් ආදර්ශ රැසක් ලැබිය හැකි බව ද පහදන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සිදුහත් බෝසතාණන් ආසන්න පෙර භවයෙහි තව්තිසා දෙව්ලොව දිව්‍ය පුත්‍රයකු ව සිටි බව.
  - සහම්පති මහා බ්‍රහ්මයා ඇතුළු දෙවියන්, බෝසත් දෙවියන්ට මනුලොව ඉපදීමට ආරාධනය කළ බව. (කාලෝයං තේ මහාවීර .... ගාථාව ඇසුරින්)
  - බෝසතාණන් වහන්සේ මනුලොව ඉපදීමට පෙර පස්මහ බැලුම් (පංච මහා විලෝකනය) බැලූ බව.

- ඇසළ පුන් පොහෝදා බෝසතාණන් වහන්සේ මහාමායා මව්කුස පිළිසිඳ ගත් බව.
- මෙදින මහාමායා දේවිය දුටු සිහිනය, උගත් බමුණන්ගෙන් විමසූ බව.
- දරුවකු පිළිසිඳ ගැනීම සිහිනයෙන් සංකේතවත් වූ බව.
- සුදෝවුන් රජතුමා ඇතුළු මාළිගයේ සිටි පිරිස විසින් මහාමායා දේවිය හොඳින් රැකබලා ගත් බව.
- දේවියගේ ගැබට දසමස සපිරෙණ කල්හි, දෙව්දහනුවර සිටි ඇගේ දෙමව්පියන් වෙත පෙරහරින් පිටත් කර යැවූ බව.
- අතරමග පිහිටි ලුම්බිණි සල් උයනෙහි අලංකාරය දුටු දේවිය එහි සිරි නැරඹීමට නැවතුණ බව.
- සල් උයනේ මලින් පිරුණු සල් ගසක් යට දී බෝසතුන් බිහිවීම හා ඒ මොහොතේ අසිරිමත් සිදුවීම් රැසක් වූ බව.
- සත්පියුම් මත වැඩ සීහනාද පැවැත්වීම (අග්ගෝහමස්මි ලෝකස්ස .......ගාථාව) එක් අසිරිමත් සිදුවීමක් බව.
- සුදොවුන් රජ විසින්, දෙව්දහ නුවර සිට පැමිණි පෙරහැරත් සමග බිසව සහ කුමරු කිඹුල්වත් පුර මාළිගයට ගෙන්වා ගන්නා ලද බව.
- බෝසත් උපතට අදාළ මෙම සිදුවීම් මගින් මාතෘත්වයට ගරු කිරීම, හරවත් සිරිත් විරිත් අනුගමනය, යහපත් ක්‍රියාවන්හි දි පූර්ව සූදානම වැනි ආදර්ශ රැසක් ලැබිය හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

1. තව්තිසා දෙව් ලොවෙහි දී බෝසතාණන්ට සිදු කළ ආරාධනයේ සිට උපත දක්වා වැදගත් සිදුවීම් පෙළගස්වන්න.
2. බෝසත් සිරිතේ දේවාරාධනාවේ සිට උපත දක්වා සිදුවීම්වලින් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ආදර්ශ ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** : විහාරස්ථානයක බුදු සිරිත දැක්වෙන සිතුවම්/මූර්ති නැරඹීමට දරුවා සමග ගොස් ඒවා පිළිබඳ ගෞරවයෙන් පහදා දෙන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 6.1.2 :** සිදුහත් බෝසත් සිරිතෙන් ආදර්ශ ගෙන ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට ශිල්ප දැක්වීම තෙක් සිදුවීම් ගෙන හැර දක්වයි.
- සිදුහත් කුමාර චරිතයේ ආදර්ශ දැක්වෙන ලේඛනයක් පිළියෙල කරයි.
- ළමා වියේ සිට දක්ෂ ලෙස ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමෙන් ජීවිතය සාර්ථක කර ගත හැකි බව පිළිගනියි.
- තම සහජ දක්ෂතා මතුකර ගනිමින් ඉගෙනුමෙහි යෙදෙයි.
- අභියෝගාත්මක අවස්ථාවල දී ඒවා ජය ගැනීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට ශිල්ප දැක්වීම තෙක් කරුණු සාකච්ඡා කිරීම මෙම පාඩමේ දී අපේක්ෂිත බැවින්, එයට ගැළපෙන අයුරින් පාඩම සංවර්ධනයට කටයුතු කරන්න.

**පියවර 1 :**

- ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සාකච්ඡාවක් අරඹා සිදුහත් කුමරුගේ ශිල්ප දැක්වීම සාකච්ඡා කරන්න.
- සිදුහත් කුමරු මැනවින් සිප්සතර හැදෑරූ බැවින් කුමරුට බොහෝ දෙනා ගරු සැලකිලි කළ බවත් පහදන්න.
- මැනවින් ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම අනාගත දියුණුවට හේතු වන බව ද පෙන්වා දෙන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බෝසත් කුමාරයා දැකීමට සුදොවුන් රජුගේ ගුරුවරයා වූ අසිත තවුසා මාළිගාවට පැමිණ අනාවැකියක් පැවසූ බව හා බිළිඳු වුවත් කුසලතා සම්පන්න නිසා බෝසත් කුමරුට වන්දනා කළ බව

- සිදුහත් කුමරුගේ මුල් ළමාවිය හා බැඳි සුවිශේෂ සිදු වීම් රැසක් ඇති බව
  - පිය රජුගේ පළමු වැඳීම
  - නම් තැබීමේ උත්සවය
  - මහාමායා දේවිය කලුරිය කිරීම
  - මහා ප්‍රජාපතී ගෝතමී මව් තනතුරට පත්වීම
  - වප් මඟුල් උත්සවය හා එහි දී සිදු වූ අසිරිමත් සිදු වීම
  - පිය රජුගේ දෙවන වැඳීම
- සර්වමිත්‍ර බමුණු පඬිවරයාගෙන් ශිල්ප හැදෑරූ බව
- සුදොවුන් රජතුමා විසින් තම පුතුට මාළිගා තුනක් ඉදිකර වන ලද බව
- නියමිත වකවානුවල දී ශිල්ප හැදෑරීම වැදගත් බව
- ශිල්ප හැදෑරීමේ දී තම අනාගත අපේක්ෂා පිළිබඳ අවධානයෙන් කටයුතු කළ යුතු බව
- ශාස්ත්‍රීය දැනුම හා ශිල්පීය හැකියාව විවාහයේ දී බලපාන වැදගත් සාධකයක් බව
- සිදුහත් කුමරු යසෝදරා කුමරිය සමග විවාහ වූ බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

1. සිදුහත් කුමාර චරිතයේ උපතේ සිට ශිල්ප දැක්වීම තෙක් වැදගත් සිදුවීම් පෙළගස්වා ඉදිරිපත් කරන්න.
2. සිදුහත් කුමාර චරිතයේ පාඩමට නියමිත කොටසින් ශිෂ්‍යයකුට ගත හැකි ආදර්ශ පෙළගස්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. බෝසත් සිරිත නිරූපණය කෙරෙන චිත්‍ර එකතුවක් සකස් කරන්නට දරුවා යොමු කරන්න.
2. දරුවාගේ දක්ෂතා සහ යහගුණ සැමවිට අගය කොට , අගයන ලද එම අවස්ථා පොතක සටහන් කිරීමට දරුවා යොමු කරවන්න.
3. එම ඇගයීම් අවස්ථා යම් ප්‍රමාණයක එකතුවක දී දරුවා දිරිගැන්වීමේ කුඩා හෝ ත්‍යාගයක් පිරිනමන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 6.1.3 :** සිදුහත් බෝසත් සිරිතේ අභියෝග හදාරා ජීවිත අභියෝග ජය ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- සිදුහත් බෝසත් චරිතයේ අභියෝග තිබූ බවට නිදසුන් සපයයි.
- සිදුහත් බෝසතුන් අනාගත දැක්මෙන් යුතු ව කටයුතු කළ බව පිළිගනියි.
- "අභියෝග ජය ගනිමු". මාතෘකාව යටතේ කථා පිටපතක් සකසයි.
- තීරණ ගැනීමේ දී විමර්ශනශීලී ව කටයුතු කරයි.
- එදිනෙදා ජීවිතයේ දී නිවැරදි හා ඍජු තීරණ ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සිදුහත් බෝසත් කුමරුගේ විවාහයේ සිට බුද්ධත්වය තෙක් කරුණු හැදෑරීම මෙම පාඩමේ දී අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සාම්ප්‍රදායික විවාහ මංගල්‍යයක් දැක්වෙන රූප රාමු සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සිසුන්ගේ පෙර දැනුම විමසා පහත සඳහන් කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිදුහත් කුමරු විවාහය සඳහා, ශිල්ප දැක්වීම අභියෝගයක් භාර ගැනීමක් බවත්, සිදුහත් කුමරු මෙවන් අභියෝග රැසකට මුහුණ දුන් බවත් පෙන්වා දෙන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සිදුහත් කුමරු යසෝදරා දේවිය සමග ආදර්ශවත් සාර්ථක යුග දිවියක් ගත කළ බව
  - දැසි දසුන්ට පවා සමානාත්මතාවෙන් යුතු ව සැලකූ බව
  - මාළිගයෙන් බැහැර ලෝකය දෙස විමසිලිමත් වූ බව
  - සතර පෙරනිමිතිවලින් අනාවරණය කරගත් යථාර්ථයට සාර්ථක ව මුහුණ දුන් බව
  - කිසා ගෝතමිය විසින් පවසන ලද නිබ්බුත පද ඇසීමෙන් නිවීම පිළිබඳ අදහසක් ඇති වූ බව
  - රාහුල පුතුගේ උපත නිසා පිතෘත්වය ලද බව
  - සියලු සත්වයින්ගේ යහපත උදෙසා රජ සම්පත් හැරදමා ගිහි ගෙදරින් බැහැර වූ බව
  - එදින ඇසළ පුරපසළොස්වක පොහොයක් වූ බව

- සට්කාර බ්‍රහ්මයා විසින් පිළිගන්වන ලද සිවුරු පිරිකර භාර ගෙන පැවිදි වූ බව
- බිම්බිසාර රජු හමු වූ බව
- ගුරුවරුන් සොයා ගිය බව (ආලාරකාලාම, උද්දකරාමපුත්ත)
- පස්වග තවුසන් හමු වූ බව
- දුෂ්කර ක්‍රියා අභියෝගයට සය වසරක් මුහුණ දුන් බව
- මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ විට පස්වග තවුසන් බෝසතුන් හැර ගිය බව
- බුද්ධත්වයට පෙර දින සිහින පහක් දුටු බව
- වෙසක් පුන් පොහෝ දින සුජාතා සිටු දියණිය කිරිපිඩු දානය පිළිගැන් වූ බව
- සවස් කල ඇසතු රුක්මුල වෙත වඩින අතර මග දී සොත්ථිය බමුණා විසින් කුස තණ පිළිගන්වන ලද බව
- චතුරංග සමන්වාගත වීර්යය උපදවා ගෙන ඇසතු රුක්මුල වජ්‍රාසනය මත වැඩ හුන් බව
- ආනාපානසති භාවනා ප්‍රවේශයෙන් සිත සමාධිගත කොට ත්‍රිවිද්‍යා උපදවා ගත් බව
- වෙසක් පුන් පොහෝ දින පශ්චිම යාමයේ දී මරසෙන් පරදවා ලොව්තුරා බුද්ධත්වයට පත් ව මිනිසකුට සතු කරගත හැකි උත්තරීතර අවබෝධය , මහා ප්‍රඥාව සාක්ෂාත් කර ගත් බව
- මෙම සිදුවීම් අධ්‍යයනයෙන් ජීවිත අභියෝග ජය ගැනීමට මහගු පිටිවහලක් ලැබිය හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

ඔබ කණ්ඩායමට ලැබී ඇති මාතෘකාව කියවා එම අවස්ථා හා එහි දී මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

1. සිදුහත් කුමරුගේ ශිල්ප දැක්වීමේ සිට සතර පෙර නිමිති දැකීම තෙක්
2. මහාභිනිෂ්ක්‍රමණය සිට දුෂ්කර ක්‍රියාව දක්වා
3. දුෂ්කර ක්‍රියා කාලය සහ බුද්ධත්වය තෙක්

**ගෙදර පරිසරයෙන් :**

1. ඔබේ දරුවා ඍජුව මුහුණ දෙන හෝ ඔහුගේ ඇස ගැටෙන ජීවිත අභියෝග, ප්‍රශ්න, ගැටලු සටහන් කිරීමට යොමු කරවන්න.
2. එම ගැටලු පිළිබඳව, රාත්‍රී කෑම මේසයේ දී හෝ වෙනත් වෙන්කර ගත් අවස්ථාවක දී හෝ ඉතා සැලකිලිමත් ව දරුවා සමග සාකච්ඡා කරන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගි කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.1** : අවබෝධයෙන් යුතු ව වන්දනාමාන හා වතාවත්වල යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- පන්සලට ගොස් වන්දනා කිරීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පැහැදිලි කරයි.
- බුද්ධ වන්දනය අර්ථාන්විත ව ගෞරවාන්විත ව කළ යුතු බව පිළිගනියි.
- වන්දනා කිරීමේ දී අනුගමනය කළ යුතු ආකාරය දැක්වෙන උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.
- දෛනික ව තෙරුවන වන්දනයේ යෙදෙයි.
- ක්‍රමානුකූල ව ආගමික කටයුතුවල යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දෛනික ජීවිතයේ දී අර්ථාන්විත ව ආගමික වතාවත්හි යෙදීමෙහි ඇති වැදගත්කම හා එහි යෙදීම පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පෝය දිනක පන්සල් යාම පිළිබඳ ව විමසා විහාරස්ථානයේ වැඳුම් පිදුම් කටයුතුවල දී හැසිරෙන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් පාඩමට පිවිසිය හැකි වේ.
    - බෞද්ධ ආගමික කටයුතුවල දී භාවිත කෙරෙන ශාසනික වචන, වැඳුම් - පිදුම් කරන ස්ථාන හා වතාවත් පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වන අතර, පිරිසිදු බව, පිළිවෙළ සැමවිට ප්‍රමුඛ වන බව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 2** :

- පාසලට ආසන්න විහාරස්ථානයකට යෑමට සැලසුම් කරන්න.
- විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා ගන්න.
- විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේට ආරාධනා කොට පාඩමේ අවශ්‍යතාව පිළිබඳ දැනුම්වත් කරන්න.
- දෙමාපිය සහාය අවශ්‍ය පරිදි ලබා ගන්න.
- ගවේෂණ පත්‍රිකා දරුවන්ට ලබා දෙන්න.
- සැලසුම් කළ පරිදි අදාළ දිනයේ දී විහාරස්ථානයට ගොස් වන්දනා හා වතාවත්වල යෙදෙන්න.

**පියවර 3** :

- විහාරස්ථානයට ගොස් පහත දැක්වෙන පියවර ඔස්සේ වතාවත් ඉටු කළ යුතු බව පැහැදිලි කර දෙන්න.

  i. විහාරස්ථානයට පිවිසීමේ දී පාවහන්, හිස් වැසුම් ඉවත් කොට සුදුසු ස්ථානයක තැබීම

  ii. ස්වාමීන් වහන්සේ හමු වී වැඳ අවසර ලබා ගැනීම

  iii. මූලික වතාවත් ලෙස සෑ මළුව, බෝ මළුව, විහාර මළුව සහ විහාර මන්දිරය ඇමද මල් අසුන්හි පරමල් ඉවත් කර කසල පිරිසිදු කිරීම

  iv. ත්‍රිවිධ චෛත්‍යය වෙත පූජා ද්‍රව්‍ය තැන්පත් කිරීම

  v. ස්වාමීන් වහන්සේට වැඩ සිටීමට පිරුවට යොදා අසුනක් පැනවීම

  vi. ස්වාමීන් වහන්සේ වැඩමවා පූජාව සිදු කිරීම

  vii. ස්වාමීන් වහන්සේගෙන් අවසර ලබා ගවේෂණ පත්‍රිකා කිහිපයක් දරුවන් ලවා ඉදිරිපත් කරවා ඌන පූරණ සකසා ගැනීම

  viii. ස්වාමීන් වහන්සේට ගිලන්පස පූජා කිරීම

  ix. ගෞරවනීය ලෙස පිරිකර පූජා කිරීම

  x. අවසානයේ දී, ඉවත් කළ යුතු පූජා ද්‍රව්‍ය ඉවත්කර පූජාසන පිරිසිදු කිරීම

  xi. ස්වාමීන් වහන්සේගෙන් අවසර ගෙන ආරක්ෂිත ව පාසල වෙත පැමිණීම

  xii. සැම විට ශාසනික වචන භාවිත කිරීම

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

1. ආගමික වතාවත්වල දී භාවිත ශාසනික වචන ලැයිස්තු ගත කරන්න.
2. විහාරස්ථානයක් තුළ වන්දනයේ දී හා වතාවත්වල දී අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙළ පන්තියට ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. නිවසට සමීප විහාරස්ථානයකට දරුවා සමග ගොස්, පෙර දින පාසලේ අදාළ ක්‍රියාකාරකම දරුවාගෙන් අසා ඒ අනුව වතාවත්වල නිරතවන්න.
2. දරුවාට ප්‍රමුඛත්වය දී සාමූහික ව ගාථා කියවීම, වන්දනා කිරීම , ස්වාමීන් වහන්සේට පූජා කෙරෙන පූජා භාණ්ඩ සකස් කිරීම, පූජා කිරීම දරුවා මගින් ම සිදු කරන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.2 :** භාවනාවේ අවශ්‍යතාව තේරුම් ගෙන නිවැරදි ඉරියව්වෙන් භාවනාවට යොමු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- මෛත්‍රී භාවනාව වඩන ආකාරය පැහැදිලි කරයි.
- මෛත්‍රී භාවනාවෙන් මිතුරු සිතුවිලි වැඩි වන බව පිළිගනියි.
- මෛත්‍රී භාවනාවේ නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.
- ඉවසීමෙන් කටයුතු කරයි.
- දෛනික කටයුතුවල දී සන්සුන් ව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

මෛත්‍රී භාවනාව පිළිබඳ හැඳින්වීමක් ශිෂ්‍යයාට ලබාදීම මෙම පාඩමේ දී අපේක්ෂා කෙරේ.

**පියවර 1 :**

- සන්සුන්, නිදහස් ස්ථානයකට සිසුන් සමග යන්න.
- ගුරු භවතා සිසුන් සමග භාවනා ඉරියව්වේ විනාඩි 02ක් පමණ වාඩිවී සිටින්න.
- ඉරියව්වෙන් නැගී සිට සිසුන් භාවනා කර ඇත් දැයි විමසන්න.
- වඩාත් හුරුපුරුදු භාවනාව කුමක්දැයි ශිෂ්‍යයන්ගෙන් අසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න
  - ක්‍රීඩාවෙන් කායික නිරෝගීතාව ඇති වන බවත්, පුද්ගලයෙකුට කායික නිරෝගීතාව මෙන් ම මානසික නිරෝගීතාව ද වැදගත් වන අතර
  - මානසික නිරෝගීතාව පවත්වා ගැනීමට භාවනාව වැදගත් වන බව පැහැදිලි කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - i භාවනාව වැඩීම සඳහා සුදුසු ස්ථානයකට සිසුන් රැගෙන යෑම (විහාරය, පාසලේ බුදුමැදුර, තුරු සෙවනක් හෝ වෙනත් සුදුසු ස්ථානයක්)

ii. භාවනාවේ නිවැරදි ඉරියව් නැවත ආදර්ශනය කොට පෙන්වා දීම
iii. සිසුන් භාවනාවේ යෙදවීම
iv. භාවනා කිරීමේ දී අවධානය ගිලිහෙන විට අවශ්‍ය පරිදි උපදෙස් ලබා දීම
v. ගවේෂණ පත්‍රිකාව නිවසේ දී සම්පූර්ණ කර ගෙන ඒමට උපදෙස් දීම

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** : මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. දිනපතා රාත්‍රී නින්දට යෑමට පෙර සුදුසු වේලාවක දරුවා ද එක්කර ගනිමින් මෛත්‍රී භාවනාවේ යෙදෙන්න.
2. විහාරස්ථානයට ගිය විට දරුවා ලවා ස්වාමීන් වහන්සේ විමසා භාවනා උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.3 :** තම ජීවිතය හැඩගසා ගැනීමට ශ්‍රාවක චරිත ආදර්ශයට ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- රාහුල ස්වාමීන් වහන්සේගේ චරිතය පැහැදිලි කරයි.
- රාහුල ස්වාමීන් වහන්සේගේ චරිත ලක්ෂණ හොඳ දරුවකු තුළ තිබිය යුතු බව පිළිගනියි.
- "යහපත් දරුවකු වන්නට නම්" මාතෘකාව යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.
- ගුරු දෙගුරුන්ට කීකරු වෙයි.
- වැඩිහිටි අවවාද පිළිගෙන ඒ අනුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

රාහුල පොඩි හාමුදුරුවන්ගේ ජීවිත කතාව අධ්‍යයනය කොට එමගින් ලැබෙන ආදර්ශ චරිතායනය කර ගන්නට සිසුන්ට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 1** :

- රාහුල ස්වාමීන් වහන්සේ වැලි දෝතක් උඩ දමා අවවාද අපේක්ෂා කරන ආකාරය දැක්වෙන සිතුවමක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ ව සිසුන් ගෙන් විමසන්න.
- රාහුල කුමාරයා සිදුහත් කුමරුගේ සහ යසෝදරා දේවියගේ පුත්‍රයා බවත්,
- රාහුල කුමරු උපතින් පසු සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය සිදු වූ බවත්,
- රාහුල ස්වාමීන්වහන්සේගේ චරිතයෙන් ශිෂ්‍යයකුට ලැබිය හැකි ආදර්ශ සොයා බැලීම වැදගත් බවත් පැහැදිලි කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - යසෝදරා දේවිය නරසීහ ගාථා මගින් රාහුල කුමරුට බුදුරජාණන් වහන්සේ හඳුන්වා දුන් බව
  - රාහුල කුමරු පැවිද්ද ලද බව

- බුදුරජාණන් වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේට ධර්ම දේශනා කිරීම සඳහා උන්වහන්සේ වැඩසිටි කුටියට වැඩම කළ බව
- කැඩපතේ උපමාව හා ජල බඳුනේ උපමාවලින් රාහුල ස්වාමීන් වහන්සේට දහම් දෙසූ බව
- ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර රාහුල හාමුදුරුවන්ට හිමි වූ බව
- රාහුල ස්වාමීන් වහන්සේගේ චරිතයෙන් ඉස්මතුවන ආදර්ශ සිසු දිවියට ගළපා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතය කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2."යහපත් දරුවකු සතු ලක්ෂණ" මැයෙන් උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

කණ්ඩායම 3. රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ඔබ ඉගෙන ගන්නා යහපුරුදු ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

සාධුචර්යා පුස්තකයක් සකස් කොට දෙමාපියන් අගයන යහගුණ සහ ඉටු කළ යහපත් වැඩ දරුවාට වාර්තා කොට දරුවා ලවා අදාළ පොතෙහි ලියවන්න. දරුවාගේ යහපුරුදු වෙනම ම ලියවා දෙමාපියන් ඒවා බලා සටහනක් හෝ අවම වශයෙන් අත්සනක් හෝ යොදන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.

**නිපුණතා මට්ටම 6.2.4 :** ජාතක දේශනාවල සඳහන් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් ජීවන රටාව ගොඩනගා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි.**

**ඉගෙනුම් පල :**

- අත්ථස්සද්වාර ජාතකයේ ඉගැන්වෙන දියුණුවේ දොරටු නම් කරයි.
- නීරෝගීකම මෙන්ම ගුණ නුවණ ද දියුණුව සඳහා අවශ්‍ය බව පෙන්වා දෙයි.
- "ආරෝග්‍යමිච්ඡේ පරමං ච ලාභං" යන ගාථාව නිවැරදි ව සජ්ඣායනය කරයි.
- යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.
- ජාතක කථා කියවා ඒවායේ ආදර්ශ ජීවිතයට එකතු කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

මෙම පාඩමෙන් අත්ථස්සද්වාර ජාතකයේ සඳහන් දියුණුවේ දොරටු පිළිබඳ ව දැන ඒ අනුව කටයුතු කරන්නට ශිෂ්‍යයාට මගපෙන්වීම ගුරු භවතාගෙන් අපේක්ෂා කෙරේ.

**පියවර 1 :**

- උත්සාහයෙන් දැහැමි ලෙස දියුණුවට පත් වූ පුද්ගලයින් පිළිබඳ දරුවන්ගේ දැනුම විමසන්න.
- ඔවුන් එම තත්වයට පත් වූයේ කවර ගුණාංග නිසා දැයි විමසන්න.
- උත්සාහයෙන් කටයුතු කිරීම සාර්ථකත්වයේ පදනම වන අතර යහපත් උත්සාහයෙන් දියුණු වීම බුදු දහම අනුමත කරන බව පැහැදිලි කොට දියුණුවන්නකු සතු ව පැවතිය යුතු ගුණාංග හැදෑරීම වැදගත් බව ද පෙන්වා ඇත.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - එක්තරා පුතකු දියුණු වීමට අවශ්‍ය ම කරුණු මොනවාදැ යි තම පියාගෙන් විමසූ බව
  - පියා තම පුතා සමග බුදුරජාණන් වහන්සේ හමුවට ගොස් එම ප්‍රශ්නය ඉදිරිපත් කර පිළිතුරු ලබා දුන් බව

- "ආරෝග්‍යාමිච්ඡේ පරමං ච ලාභං" යනුවෙන් පැවසෙන ගාථාවේ දියුණුවට ඉවහල් වන කරුණු හයක් ඇති බව
- එම කරුණු හය අනුගමනය කළ සිටු පුත්‍රයා තම ජීවිතය ඉසුරුමත් ව හා සදාචාර සම්පන්න ව ගත කළ බව
- දෛනික ජීවිතයේ සාර්ථකත්වයට මෙම දියුණුවේ දොරටු උපයෝග කරගත හැකි බව
- කුඩා කල සිට ම ධාර්මික ව දියුණු වීමට කළ යුතු දේ ගැන විමසිලිමත් වීම වැදගත් බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. අත්ථස්සද්වාර ජාතක කථාව නාට්‍යයක පිටපතක් ලෙස ලියන්න.

කණ්ඩායම 2. ගාථාව නිවැරදි ව සජ්ඣායනා කිරීමට හුරුවන්න. එහි ඇතුළත් දියුණුවට ඉවහල් වන අංග හය ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. දියුණුවේ දොරටු හය දෛනික ජීවිතයේ සංවර්ධනයට යොදාගත හැකි ආකාරය ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

- දෙමාපියන් ද අදාළ ගාථාව දරුවාගෙන් අසා පාඩම් කොට සුදුසු අවස්ථාවන්හි දරුවන්ට ඇසෙන සේ කියන්න.
- තමන් උත්සාහවත් ව ක්‍රියා කොට ලද ජයග්‍රහණ පිළිබඳ අවස්ථාවෝචිත ව දරුවන් දැනුවත් කරන්න.
- එබඳු වෙනත් චරිත කථා පිළිබඳ කලාතුරකින්වත් (ඉඳහිට හෝ විටින් විට ) දරුවන්ට රසවත් ව ප්‍රකාශ කරන්න.
- ගාථාවේ කරුණු නිවස තුළ ප්‍රායෝගීකරණය කරන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 6.3.1** : බුදු දහමේ ඉගැන්වෙන සීලය හැඳින සදාචාරාත්මක ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහමේ ඉගැන්වෙන සීලය කෙටියෙන් පැහැදිලි කරයි.
- ශිෂ්‍යයකු ලෙස කුඩා කල සිට ම සීලය පුරුණු කළ යුත්තක් බව පෙන්වා දෙයි.
- සිල්වත්වීමේ අගය දැක්වෙන නිර්මාණ ඉදිරිපත් කරයි.
- අන්‍යයන්ට ආචාරශීලි වෙයි.
- කය වචනයේ සංවර බව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බෞද්ධ ඉගැන්වීම් පාදක කර ගනිමින් සීලය පිළිබඳ ව සරල හැඳින්වීමක් මෙම මාතෘකාව යටතේ අපේක්ෂිත ය.

**පියවර 1** :

- ''කායෙන සංවරෝ සාධු'' යන ධම්ම පද ගාථාව සිසුන්ට ඉදිරිපත් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- කය, වචනය හා මනස යන තිදොරෙහි සංවරවීමේ වැදගත්කම දැක්වීම ගාථාවේ මූලික අදහස බවත්, කය සහ වචනයේ සංවර වීම සීලය බවත්, සිල්වත් වීමෙන් මහත් අනුසස් ලැබෙන බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - කය සහ වචනය සංවර කර ගැනීම සඳහා එදිනෙදා ජීවිතයේ දී ක්‍රියා කළ යුතු බව.
    - සිල්වත්වීම නිසා ගැටුම්කාරී තත්වයෙන් මිදී සහජීවනයෙන් යුතු ව කටයුතු කළ හැකි බව

- කීර්තිය, භෝග සම්පත් ලැබීම, භයක් නොමැති ව ඉදිරියට යාමට හැකිවීම, දෙවියන්ගෙන් ආශිර්වාද ලැබීම, සිත එක්තැන් කිරීමට (සමාධිය) හැකි වීම සීලයේ අනුසස් කිහිපයක් ලෙස ඉදිරිපත් කළ හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. එදිනෙදා ජීවිතයේ දී කය සංවර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. එදිනෙදා ජීවිතයේ දී වචනය සංවර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. සිල්වත් වීමේ අගය පැහැදිලි කෙරෙන කෙටි නාට්‍යයක් නිර්මාණය කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පොහොය දිනවල දරුවා සමග විහාරස්ථානයට ගොස් සිල් සමාදන් වීමට කටයුතු කරන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 6.3.2 :** පංචසීලය හැඳින පවින් වැළකී යහපත් ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- සිල්පද පහ නිවැරදි ව අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි.
- පංචසීල ප්‍රතිපත්තියෙන් නිවැරදි දිවි පැවැත්මක් ඇති වන බව පිළිගනී.
- පන්සිල් රැකීමේ ආනිසංස වගුගත කරයි.
- පවින් වැළකී යහපතෙහි යෙදෙයි.
- අන්‍යෝන්‍ය ගරුත්වය කෙරෙහි සැලකිලිමත් ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

මෙම පද්‍ය පන්තියෙන් පන්සිල් පිළිබඳ ව සරල දැනුමක් ශිෂ්‍යයාට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

**පියවර 1 :**

- ප්‍රාණඝාතයේ හෝ වෙනත් වැරදි ක්‍රියාවක ආදීනව කියැවෙන ගීතයක් සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වා, පහත සඳහන් කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අකුසල ක්‍රියාවන්ගෙන් වැළකීම ගීතයෙන් කියවෙන අතර, කය වචනය මුල්වී සිදු කරන බව
- අකුසලයන්ගෙන් වැළකීම සීලය ලෙස හැඳින්වෙන බව
- ගිහියකු විසින් අනුගමනය කළ යුතු නිත්‍ය සීලයක් ඇති අතර එය පන්සිල් නමින් හැඳින්වෙන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේ පහළ වීමට පෙර සිට ම සමාජයේ පංචසීල ප්‍රතිපත්තිය අනුගමනය කොට ඇති බව
  - පංචසීලයේ පාලි පාඨ නිවැරදි ව ලියන ලද පුවරුවක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමෙන් ඒ පිළිබඳ ව අවධානය වැඩි කළ හැකි බව
  - පංචසීලය සුරැකීමෙන් සියලු සතුන්ට ජීවත්වීමේ ඇති අයිතිය තහවුරු වන බව හා එමගින් අන්‍යෝන්‍ය සුහදතාව හා ආත්ම ගෞරවය ආරක්ෂා වන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ශික්ෂා පද පහ සහ ඒවායේ තේරුම නිවැරදි ව ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 2. පන්සිල් සුරැකීමෙන් ලැබෙන ආනිසංස ලැයිස්තතු ගත කරන්න.

කණ්ඩායම 3. ශික්ෂා පද ආරක්ෂා කිරීමෙන් එකිනෙකාගේ ගෞරවය සුරැකෙන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පස්පවින් මිදුණ ආදර්ශවත් දරුවකු ගොඩනගා ගැනීමට සුදුසු ලෙස ගෙදර වැඩ කටයුතු හා වෙනත් ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
**නිපුණතා මට්ටම 6.3.3** : මව් පිය ගුණ හැඳින තම යුතුකම් ඉටුකරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- දෙමව්පියන් දරුවන්ට ඉටුකරන යුතුකම් පැහැදිලි කරයි.
- කුඩා කල තමාට පිහිට වූ දෙමව්පියන්ට කෘතගුණ දැක්විය හැකි අයුරු පෙන්වා දෙයි.
- දෙමව්පිය අගය දැක්වෙන කවි නිර්මාණය කරයි.
- දිනපතා උදේ සවස දෙමාපියන් නමදියි.
- දෙමව්පියන් කෙරෙහි ගෞරවාන්විත ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සිගාලෝවාද සූත්‍රය ඇසුරින් මව්පිය ගුණ හැඳින යුතුකම් ඉටුකිරීම පිළිබඳ ව මෙම පාඩමෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය.

**පියවර 1** :

- සාම කුමාරයාගේ කථාව සිසුන් සමග සාකච්ඡා කරමින් සිහිපත් කරවන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සාම කුමාරයා දෙමව්පියන්ට තම යුතුකම් මැනවින් ඉටු කළ බව හා දෙමව්පියන්ට සැලකීම ඉතා වැදගත් කාර්යයක් බව
- මව්පියන්ට සැලකීම පිළිබඳ ව සිගාලෝවාද සූත්‍රයේ කරුණු ඇතුළත් වන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේ තම දෙමව්පියන් වෙනුවෙන් යුතුකම් මැනවින් ඉටුකළ බව
  - දෙමාපියන් සියලු කටයුතු සිදුකරන්නේ දරුවන්ගේ යහපත වෙනුවෙන් බව
  - සිගාලෝවාද සූත්‍රයේ එන නැගෙනහිර දිශා නමස්කාරයෙන් දෙමාපිය - දූ දරු යුතුකම් පැහැදිලි කෙරෙන බව
  - බුදුරජාණන් වහන්සේ දෙමව්පියන් මහා බ්‍රහ්මයාට සමාන කොට "බ්‍රහ්ම" යන ගෞරව නාමයෙන් හඳුන්වා ඇති බව

- දරුවන් විසින් දෙමව්පියන්ට ඉටු කළ යුතු යුතුකම් පහක් ඇති බව
- දරුවන් ශිෂ්‍ය අවධියේ දී මැනවින් ඉගෙන ගනිමින් දෙමාපිය බලාපොරොත්තු ඉටු කිරීමට දරන උත්සාහය සුවිශේෂ වූවක් බව
- තමාගේ මුළු ජීවිත කාලය පුරා ම දෙමව්පියන්ට සැලකුවත්, ප්‍රමාණවත් නොවන බව
- දෙමව්පියන් මියගිය පසු තම ජීවිත කාලය පුරාම ඔවුන්ට පින් පෙත් අනුමෝදන් කරමින් මව්පිය ගුණ සිහි කිරීම අගය කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන කරුණු ඇසුරෙන් දෙමාපියන්ට උපකාර පිණිස දරුවන් විසින් ඉටුකළ යුතු යුතුකම් විස්තර කරන්න.

කණ්ඩායම 2. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි යුතුකම් අවධානයට ගනිමින් පාසල් ශිෂ්‍යයකු වශයෙන් දෙමව්පියන්ට ඉටු කළ හැකි යුතුකම් විස්තර කරන්න.

කණ්ඩායම 3. සිගාලෝවාද සූත්‍රයට අනුව ඔබට දෙමාපියන් ඉටු කරන යුතුකම් දැක්වෙන කවියක් නිර්මාණය කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දෙමාපියන් තම දෙමාපියන්ට (දරුවාගේ ආච්චි, සීයා) උපස්ථාන, වන්දනාමාන කිරීමේ දී දරුවන් සමග එක් ව කටයුතු කරන්න.

**නිපුණතාව 04** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 6.4.1** : වගකීම හා වගවීම තේරුම් ගෙන ඊට උචිත පරිදි තම චර්යාව හැඩගසා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- පෞරුෂය ගොඩනගා ගැනීම තමාගේ දියුණුවට හේතු වන ආකාරය විස්තර කරයි.
- තමාට ලැබෙන තනතුරු වගකීමෙන් හා වගවීමෙන් දැරිය යුතු බව පිළිගනී.
- මඝ මානවක ජාතකය රඟ දක්වයි.
- අභියෝග හමුවේ නොසැලී කටයුතු කරයි.
- කණ්ඩායමක සාමූහිකත්වයෙන් හා වගකීමෙන් යුතු ව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මඝමානවක ජාතකයේ එන වගකීම හා වගවීම ශිෂ්‍ය ජීවිතයට චරිතායනයට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ටිබෙට් ජාතික එස්.මහින්ද හිමියන් විසින් රචිත පහත සඳහන් කවිය ගායනයට සිසුන් යොමු කරන්න.

  ඉටු කොට කළ යුතු යුතුකම් - ලැබුණත් ලෝකෙන් ගැරහුම්

  ඉවසන්නට පුළුවන් නම් - නුඹයි මගේ පුතා උතුම්
- කවියේ අදහස සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - උත්සාහයෙන් කටයුතු කළ යුතු බව
  - යුතුකම් ඉටුකිරීම වැදගත් බව
  - වගකීමෙන් , වගවීමෙන් අභියෝග ජයගත හැකි බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදුරජාණන් වහන්සේ උපාය කුසලතාවෙන් ඉදිරියට ගිය තරුණයකු අරබයා මඝ මානවක ජාතකය දේශනා කළ බව.

- උත්සාහයෙන්, වගකීමෙන් හා සත්‍ය ගරුක ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණය කරා ළඟා විය හැකි බව
- තම අරමුණ කරා යාමේ දී ඉදිරිපත් වන බාහිර අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීම මඝ මානවකගේ දෙලොව දියුණුවට හේතු වූ බව
- මෙම ආදර්ශ සැලකිල්ලට ගනිමින් ජීවිත සාර්ථකත්වය සඳහා ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. මඝ මානවක ජාතකය රඟ දැක්වීමට සූදානම් වන්න.

කණ්ඩායම 2. මඝ මානවක ජාතකය ඇසුරින් තම ජීවිතය සාර්ථක කර ගැනීමට ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දරුවන්ට වගකීම් පවරා, ඔවුන්ගේ සහාය ලබා ගනිමින් නිවසේ කාර්යයන් මැනවින් ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.

**නිපුණතාව 05 :** ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.5.1 :** ශ්‍රී ලාංකිකයන්ට ආවේණික ජාතික සංකේත හැඳින ඒවා සුරකිමින් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02යි.

**ඉගෙනුම් පල :**

- ජාතික සංකේත ඇසුරින් ජාතියේ අනන්‍යතා ලක්ෂණ පැහැදිලි කරයි.
- ජාතික සංකේත භාවිතයේ දී එහි අභිමානය සුරැකෙන පරිදි කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි.
- ජාතික ගීයට හා ජාතික කොඩියට ගරු කරයි.
- ජාතික කොඩිය හා ජාතික ගීය අනුමත අවස්ථාවල පමණක් භාවිත කරයි.
- ජාතික වෘක්ෂය හා ජාතික පුෂ්පය රැක ගැනීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය හා ජාතික පුෂ්පය ගැන අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ජාතික ගීය, ජාතික කොඩිය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය පිළිබඳ දැක්වෙන රූප රාමු සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඉදිරිපත් කරන ලද රූප රාමු ඇසුරින් ශ්‍රී ලාංකික අනන්‍යතාව මූර්තිමත් වන බව
  - ජාතික අනන්‍යතාව පෙන්නුම් කිරීමට සංකේත භාවිත කරන බව
  - ජාතික ගීයට නිසි ගෞරවය පුද කළ යුතු බව
  - ජාතික කොඩිය අභිමානයෙන් යුතු ව භාවිත කළ යුතු බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - රටක් හඳුනා ගත හැකි අනන්‍යතා ලක්ෂණ ඇති බව
  - ජාතික කොඩියෙහි නිරූපිත සංකේතවලින් පෙන්නුම් කෙරෙන නියෝජනයන් අර්ථවත් වන බව

- ජාතික ගීයෙන්  ජාතියේ අනන්‍යතාව පැහැදිලි කෙරෙන බව
- ජාතික ගීය හා ජාතික කොඩිය භාවිත කෙරෙන විශේෂ අවස්ථා ඇති බව
- ජාතික වෘක්ෂය හා ජාතික පුෂ්පය පිළිබඳ තොරතුරු හැදෑරිය යුතු බව
- ජාතික ගීයෙන් හා ජාතික කොඩියෙන් සහජීවනය හා බෞද්ධ අනන්‍යතාව මූර්තිමත් වන බව

**ගුණාත්මක යෙදවුම් :** පෙදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ  ඉගෙනුම් පල  සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක  සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ජාතික ගීය නිවැරදි ව ලියන්න. ජාතික කොඩියෙහි නිරූපිත අංග විස්තර කරන්න.

කණ්ඩායම 2. ජාතික කොඩිය හා ජාතික ගීය භාවිත කළ හැකි අවස්ථා පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ජාතික කොඩියෙන් හා ජාතික ගීයෙන් මතු වන සහජීවන ලක්ෂණ විස්තර කරන්න.

කණ්ඩායම 4. ජාතික කොඩියෙන් හා ජාතික ගීයෙන් මතු වන බෞද්ධ අනන්‍යතා ලක්ෂණ පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

ජාතික අනන්‍යතාව තේරුම් කර දෙමින්, අපේ දේ යන්න තහවුරු වන සේ, ශ්‍රී  ලාංකිකත්වය සාඩම්බරයෙන් අගය කරන්නට ඉදිරිපත් වන පරිදි දරුවාගේ මානසිකත්වය සංවර්ධනය වන ආකාරයේ පරිසරයක් නිවසේ ඇති කරන්න.

**නිපුණතාව 06** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.6.1** : හොඳ, නරක පිළිබඳ බෞද්ධ නිර්ණායක හැඳින යහපතෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- හොඳ නරක සරල ව හඳුන්වයි.
- අකුසලයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් යහපත් අයෙකු විය හැකි බව පිළිගනියි.
- යහපත් සිරිත් ලේඛනයක් පිළියෙල කරයි.
- බෞද්ධ නිර්ණායක අනුව දෛනික ක්‍රියාවන්හි යෙදේ.
- යහපතෙහි හැසිරෙමින් ගුණ ගරුක ජීවිතයක් ගත කිරීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය හා ''තං ච කම්මං කතං සාධු'' සහ ''න තං කම්මං කතං සාධු'' යන ධම්ම පද ගාථා ඇසුරින් හොඳ නරක පිළිබඳ සරල හැඳින්වීමක් මෙම පාඩමේ දී අපේක්ෂා කෙරේ.

**පියවර 1** :

- භෞතික පරිසරයේ මිනුම් කටයුතුවල දී භාවිත කරන ඒකක පිළිබඳ සිසුන් ගෙන් විමසා, පහත සඳහන් කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - භෞතික පරිසරයේ දිග, පළල, උස, බර මැනීමට විවිධ මිනුම් දඬු භාවිත කරන බව
  - විවිධ කාර්යයන්හි දී මෙම මිනුම් දඬු නිවැරදිව භාවිතයට ගන්නා බව
  - ක්‍රියාවක හොඳ නරක තක්සේරු කිරීමට ද මිනුම් දඬු ඇති බව
  - එම මිනුම් දඬු මොනවාදැයි සොයා බැලිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - හොඳ නරක දෙක ම සමාජයේ පවතින බව
  - කළ දේ පිළිබඳ ව පසු ව පසුතැවීමට හේතු වන ක්‍රියා නරක බව
  - පසුතැවීමට සිදු නොවන සිත සනසන ප්‍රතිඵල ලැබෙන ක්‍රියා හොඳ බව
  - තමන්ටත් අනුන්ටත් විපත පිණිස පවතින ක්‍රියා නරක බව

- තමන්ටත් අනුන්ටත් විපත පිණිස නොපවතින ක්‍රියා හොඳ බව
- නරක ක්‍රියාවන්ගෙන් වැළකී හොඳ ක්‍රියාවල යෙදිය යුතු බව
- දෛනික ව සිදු කළ හැකි යහපත් ක්‍රියා නිරන්තරයෙන් ඉටු කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. "තංච කම්මං කතං සාධු" සහ "න තං කම්මං කතං සාධු" යන ධම්මපද ගාථා දෙක සජ්ඣායනා කොට සරල අදහස පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. හොඳ නරක තෝරා බේරා ගත හැකි බෞද්ධ නිර්ණායක පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියා ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

1. දරුවාගේ යහපත් නිවැරදි ක්‍රියා නිරන්තරයෙන් අගය කරන්න.
2. දරුවාගේ, යම් හෝ අවස්ථාවක වැරදි/අයහපත් ක්‍රියාවක් දුටු විට ඒවායේ වැරදි ප්‍රතිඵල ආදර්ශ කථා ඔස්සේ ඉතා ඉවසීමෙන් සුදුසු අවස්ථාවල දරුවාට පහදා දෙන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.6.2** : අනිත්‍යාතාව තේරුම් ගෙන වෙනස් වීම් හමුවේ නොසැලී කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලෝකයේ සියල්ල වෙනස් වන බව නිදසුන් මගින් පැහැදිලි කරයි.
- තමා ඇතුළු ලෝකයේ සිදු වන සියලු දේ එක ම ආකාරයකින් නොපවතින බව පිළිගනී.
- වෙනස්වීම දැක්වෙන සරල කතා පුවතක් නිර්මාණය කරයි.
- තමා හමුවට පැමිණෙන ගැටලු විශ්ලේෂණය කොට විසඳුම් සොයයි.
- අනිත්‍යතාව හමුවේ අභියෝග ජය ගනිමින් නොසැලී කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මෙම පාඩමේ දී ලෝකයේ සියල්ල වෙනස් වන බව (අනිත්‍යතාව) පිළිබඳ සරල හැඳින්වීමක් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මලක හට ගැනීමේ පටන් මිලින වීම දක්වා විවිධ අවස්ථා (කිහිපයක්) සිසුන්ට ප්‍රදර්ශනය කර එම අවස්ථා ස්වාභාවික ව සිදු වන බව පැහැදිලි කරන්න.
- පහත සඳහන් කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - මලෙක වෙනස සොබාදහම නිසා සිදු වන බව
    - වෙනස්වීම ලෝකයේ නිරන්තරයෙන් පවතින බව හා එය සෑම දෙයකට ම පොදු ධර්මතාවක් බව
    - ස්ථිරභාවයක් නොමැති දේ ආශාවෙන් දැඩිව ගැනීම දුක් සහිත වන බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - ලොව ඇති සියලු ජීවී අජීවී දේ ඒකාකාරයෙන් නොපවතින බව
    - ලොව පවතින සියල්ල වෙනස් වීමට නිශ්චිත කාල රාමුවක් නොපවතින බව
    - වෙනස් වන දේවල් ආශාවෙන් දැඩි කොට ගැනීම දුක් සහිත වන බව

- බුදු දහමේ අනිත්‍යතාව ලෙස මේ කරුණු පැහැදිලි කොට උගන්වන බව
- ප්‍රායෝගික නිදසුන් ඇසුරෙන් වෙනස් වීමේ ස්වභාවය පෙන්නුම් කළ හැකි බව
- වෙනස් වීමට නොසැලී මුහුණ දිය යුතු බව
- අනිත්‍යතාව තේරුම් ගැනීමෙන් ජීවිතයේ යථා ස්වභාවය තේරුම් ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. වෙනස්වීම ප්‍රකට කෙරෙන අවස්ථා දැක්වෙන ලැයිස්තුවක් සකස් කරන්න.

කණ්ඩායම 2. ලෝකයේ සියල්ල වෙනස් වන බව වටහා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 3. ඔබ නොසැලීමෙන් කටයුතු කළ අවස්ථා පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

වෙනස්වීම පිළිබඳ කම්පනයට පත් නොවන, ලද දෙයින් සතුටට පත් වන දරුවකු සකස්කර ගැනීමට සුදුසු පරිසරයක් නිවසේ ක්‍රියාකාරකම් ආශ්‍රිත ව පවත්වා ගන්න.

**නිපුණතාව 07** : ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 6.7.1** : තමා උපමාකොට ගෙන සියලු ජීවීන් කෙරෙහි හිතානුකම්පී ව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- අත්තූපනායික ධර්මය යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- තම ජීවිතයට තමා මෙන් සියලු සත්වයන් ද සිය ජීවිතවලට ආදරය කරන බව පිළිගනියි.
- "සබ්බේ තසන්ති දණ්ඩස්ස" ... යන ධම්මපද ගාථා දෙක නිවැරදි ව සජ්ඣායනා කොට, එම ගාථා දෙකේ අදහස් සරල ව ඉදිරිපත් කරයි.
- අන්‍යයන්ට හිරිහැර කිරීමෙන් වළකියි.
- ජීව පරිසරයට හිතානුකම්පී වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

"සබ්බේ තසන්ති දණ්ඩස්ස" යනුවෙන් ආරම්භ වන ධම්මපද ගාථා දෙකට අනුව කෙටි සමාලෝචනයක් මෙම පාඩමෙන් බලාපොරොත්තු වේ.

**පියවර 1** :

- "සුඛ කාමානි භූතානී - යෝ දණ්ඩේන විහිංසති" යනුවෙන් පැවසෙන ධම්මපද ගාථාව ප්‍රදර්ශනය කොට සිසුන් සමග නිවැරදි ව සජ්ඣායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මෙම ගාථාව ධම්මපදය දණ්ඩ වග්ගයට ඇතුළත් වන බව
  - ගාථාවේ සරල අදහස නම් සැප කැමති සත්වයින් අන් අයට හිංසා නොකළ යුතු බව
  - තමා උපමා කොට කටයුතු කිරීමෙන් බොහෝ හිංසන අවම කරගත හැකි බව
  - ජීවත්වීමේ අයිතිය ලොව සියල්ලන්ට පොදු බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ජීවත්වීමේ අයිතිය පිළිබඳ මෙම ධම්මපද ගාථා දෙකෙන් ඉගැන්වෙන බව
  - අත්තූපනායික ධර්මය අනුව කටයුතු කිරීම සමාජයට ඉතා වැඩදායක බව

- සියලු ජීවීන් කෙරෙහි  දයාවෙන් කටයුතු කළ යුතු බව
- ඒ සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග රැසක් ඇති බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ  ඉගෙනුම් පල  සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක  සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. "සබ්බේ තසන්ති දණ්ඩස්ස" යනුවෙන් පැවසෙන  ගාථාද්වය නිවැරදි ව ලියා එහි අදහස පැහැදිලි කරන්න. එම ගාථා නිවැරදි ව සජ්ඣායනා කිරීමට සූදානම් වන්න.

කණ්ඩායම 2. ජීව දයාවෙන් යුතු ව කටයුතු කිරීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. හිංසනයෙන් අන් අය වැළැක්වීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. "ආරෝග්‍ය පරමා ලාභා" යන ධම්මපද ගාථාව ඇසුරු කොට නිවසේ ආහාරදාමය, පරිසරයේ පිරිසිදු බව ඇති කිරීමට දරුවන් සමග එක් ව කටයුතු කරන්න.
2. අප කායික මානසික රෝග වාහකයෙකු නොවන ලෙස කටයුතු කිරීමට ධම්මපදයේ මඟපෙන්වීම් යොදාගත හැකි ආකාරය දරුවන්ට පැහැදිලි කර දෙමින් ඒවා ප්‍රායෝගිකරණය කරන්න.

**නිපුණතාව 07** : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 6.7.2** : භෞතික පරිසරයේ වටිනාකම තේරුම් ගෙන පරිසර සංරක්ෂණයට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි

**ඉගෙනුම් පල** :

- භෞතික පරිසරය මිනිසා හා බැඳී ඇති බව පැහැදිලි කරයි.
- පරිසරය රැකගැනීම යුතුකමක් බව පිළිගනියි.
- පරිසරය සුරැකීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කරයි.
- පරිසර පවිත්‍රතාවට හුරු වෙයි.
- ගහකොළවලට ආදරය කරමින් ඒවා ආරක්ෂා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පරිසර සංරක්ෂණය පෝෂණය හා පරිසර දූෂණයෙන් වැළකීම පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- "දෙව් ලොවද මව්බිමට දෙවැනි කොට සිතන්නෙමු......." යනුවෙන් ඇරඹෙන පරිසර ගීතය තාලයට ගායනා කරන්න.
- එහි තේරුම සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු ද මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ගීතයේ සරල අදහස, පරිසරය සුරැකීම අපගේ යුතුකමක් බව
  - ගීතයෙන් පහත සඳහන් කරුණු පෙන්වා දෙන බව
    - i. පරිසරය අප හා බැඳී පැවතීම
    - ii. පරිසර සංරක්ෂණය කළයුතු වීම
    - iii. පරිසරය පෝෂණය කළයුතු වීම
    - iv. පරිසර දූෂණය වැළැක්වීම
  - පරිසරය සුරැකීමෙන් මහඟු ඵල රැසක් ඇති වන බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - භෞතික පරිසරය හා මිනිසා එකිනෙකා අතර බැඳී පවතින බව
  - අප පරිසරය සංරක්ෂණය කළ යුතු බව

- භෞතික පරිසරයෙන් තොර ජීවී පැවැත්මක් නොමැති බව
- පරිසරය සම්බන්ධයෙන් පහත සඳහන් මාතෘකා පිළිබඳ සැලකිලිමත් විය යුතු බව (පරිසරයේ ප්‍රයෝජන, පරිසර සංරක්ෂණය, පරිසර පෝෂණය, පරිසරය දූෂණය වැළැක්වීම)
- මනා පරිසර නඩත්තුව හා අලංකරණය

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. පරිසරය සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 2. පරිසරය පෝෂණය කොට පවත්වා ගෙන යන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. පරිසර දූෂණය වැළැක්වීමට ගත හැකි ක්‍රියා මාර්ග විස්තර කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

1. ගෙවත්ත නිසි පරිදි සකස් කර ගැනීමට දරුවා සම්බන්ධ කරගන්න.
2. සැලසුම සකස් කිරීමේ දී දරුවා ද සහාය කර ගන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.8.1** : මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදුවීම් අගයමින් ශාසනික උරුමයන් රැක ගැනීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදු වීම් පැහැදිලි කරයි.
- මහින්දාගමනයෙන් ලද ශාසනික දායාද රැක ගත යුතු බව පිළිගනී.
- බෞද්ධ උරුමය යන මැයෙන් පද්‍ය නිර්මාණය කරයි.
- බෞද්ධ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරයි.
- බෞද්ධ සිරිත් විරිත්වලට අනුගත ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මහින්දාගමනය (මිහිඳු මහ රහතන් වහන්සේ තිස්ස රජතුමා හා කළ සාකච්ඡාව ) හා අනෙකුත් සුවිශේෂ සිදුවීම් පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මිහින්තලා කඳු මුදුනේ මිහිඳු මාහිමි හා තිස්ස රජ හමුව දැක්වෙන සිතුවමක් හෝ රූප රාමු ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න
- සිසුන්ගේ පෙර දැනුම සිහිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මිහිඳු හිමි හා තිස්ස රජු අතර සංවාදය ලොව පැරණිම සාමාන්‍ය දැනීම විමසීමේ අවස්ථාව හැටියට හැඳින්විය හැකි බව
  - රජතුමා ආගන්තුක පිරිසට නිසි ගෞරවය පුද කළ බව
  - මහින්දාගමනය හා බැඳුණු සිදුවීම්වලින් උගත හැකි කරුණු රැසක් ඇති බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - මුව දඩයමේ ගිය තිස්ස රජුට මිහිඳු මහරහතන් වහන්සේ මුණ ගැසුණු බව

- ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලාත්, සුමන සාමණේරයන් වහන්සේත්, භණ්ඩුක නම් වූ අනාගාමී උපාසකතුමාත් මිහිඳු මාහිමි සමග පැමිණි බව
- මිහිඳු මාහිමි හා තිස්ස රජු අතර ඇති වූ සංවාදය වැදගත් බව
- මිහිඳු මාහිමි චුල්ලහත්ථිපදෝපම සූත්‍රය රජතුමාට දේශනා කළ බව
- මෙම සූත්‍රය අසා රජු ඇතුළු පිරිස බුදුදහම වැළඳගත් බව
- අනුලා දේවිය පැවිදිවීමට කැමැත්ත පළ කළ බව
- රජතුමා මහමෙවුනා උයන භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා පූජා කළ බව
- මුල්වරට පැවිදි වූ ශ්‍රී ලාංකිකයා අරිට්ඨ කුමාරයා බව
- මිහිඳු මාහිමිගේ වැඩමවීමෙන් ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ දායාද ආරක්ෂා කර ගැනීම සැමගේ යුතුකම බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදුවීම් පිළිවෙළින් ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 2. මහින්දාගමනය හා බැඳුණු සිදුවීම්වලින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. මහින්දාගමනයෙන් ලැබුණු ශාසනික උරුමයන් රැක ගැනීමට ඔබට කළ හැකි දේවල් මොනවාදැයි පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

1. විහාරස්ථානය හා නිවස අතර අන්‍යෝන්‍ය සබඳතාව තහවුරු වන කටයුතුවල දරුවා නිරත කරවන්න.
2. මහින්දාගමනය දැක්වෙන පින්තූරයක් නිවසේ අලංකාරව රඳවන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.8.2** : දුමින්දාගමනයෙන් ලත් දායාද අගයමින් ඒවා රැක ගැනීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සංඝමිත්තා තෙරණිය වැඩමවීමෙන් අප ලද දායාද පැහැදිලි කරයි.
- දුමින්දාගමනයෙන් මෙරට විවිධ ශිල්ප කලාවන්ගේ වර්ධනය සිදු වූ බව පිළිගනී.
- දුමින්දාගමනයෙන් ලත් දායාද යන මැයෙන් නිර්මාණ ඉදිරිපත් කරයි.
- අපේ සංස්කෘතික අංගයන් රැක ගැනීමට කටයුතු කරයි.
- සැලකිල්ලෙන් බෝධි පූජාවේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩමවීම පිළිබඳ අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මහබෝ වන්නම (වැලි තල අතරේ...) ගීතය ශ්‍රවණය කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ශ්‍රී මහා බෝධියේ ආගමනය ගීතයෙන් කියැවෙන බව
  - දෙවන පෑ තිස් රජතුමාගේ ආරාධනයෙන් සඟමිත් තෙරණිය විසින් ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව ලංකාවට වැඩම කරවන ලද බව
  - බෝධි ආගමනයෙන් ලත් දායාද රැසක් ඇති බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - මිහිඳු මාහිමියන්ගේ අනුදැනුම මත සඟමිත් තෙරණිය මෙරටට වැඩම වීම පිණිස අරිට්ඨ කුමරු ඇතුළු පිරිස දඹදිවට පිටත්ව ගිය බව

- අශෝක රජතුමාගේ අනුදැනුම මත සඟමිත් තෙරණිය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව රැගෙන මෙරට දඹකොළ පටුනට වැඩම කළ බව
- තිස්ස රජු දඹකොළ පටුනේ කරවටක් දියට බැස බෝධි ශාඛාව පිළිගත් බව
- ශ්‍රී මහා බෝධියේ වතාවත සඳහා සඟමිත් තෙරණිය සමග වෘත්තීන් (ශිල්ප ශ්‍රේණි) දහ අටක ජනයා මෙරට පැමිණි බව
- උඳුවප් පුර පසළොස්වක පෝය දින අනුරාධපුර මහමෙවුනා උයනේ ශ්‍රී මහා බෝධි ශාඛාව රෝපණය කළ බව
- රජතුමා හත්ථාල්හක පිරිවෙන භික්ෂුණීන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා පූජා කළ බව
- අනුලා දේවිය ශ්‍රී ලංකාවේ මුල්වරට පැවිදි වූ කාන්තාව බව
- ශ්‍රී මහා බෝධිය මුල් කරගත් බෝධි සංස්කෘතියක් බිහි වූ බව
- විවිධ කලා ශිල්ප, විවිධ සංස්කෘතික දායාද, අප රටට ලැබී සිංහල ජාතියේ පෝෂණය සිදු වූ බව
- එකී කලා ශිල්ප ශ්‍රී ලාංකික අනන්‍යතාවෙන් යුක්ත වූ බව
- බෞද්ධයාගේ එදිනෙදා ජීවිතයේ ඇති වන ගැටලු, ලෙඩ දුක්, අපල උපද්‍රවවල දී පිහිට පතා බෝධි පූජා පැවත්වීමට යොමු වී ඇති බව
- බෝධි ආගමනයේ දායාද රැක ගැනීමට ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීමේ කතා පුවත කෙටියෙන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. අටළොස් ශිල්ප ශ්‍රේණි හේතු කොට ශ්‍රී ලංකාවේ ඇති වූ සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වූ බවට කරුණු දක්වන්න.

කණ්ඩායම 3. පැරණි සංස්කෘතික ශිල්ප ඉදිරියට පවත්වා ගෙන යාමට ඔබට කළ හැකි දේ ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

1. නිවසේ මූලිකත්වයෙන් බෝධි පූජා පිංකමක් සංවිධානය කරන්න.
2. දරුවා ක්‍රියාකාරී ව සම්බන්ධ කරගන්න.
3. සඟමිත් තෙරණිය බෝධිය වැඩම කරවීම හෝ අනුරපුර ජය ශ්‍රී මහා බෝධියේ පින්තූරයක් නිවසේ රඳවා තබන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.9.1** : සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වයි.
- සම්පත් පරිහරණය සැලැස්මක් ඇතුව කළ යුතු බව පිළිගනී.
- සාකේත නුවර සිටු දේවියගේ කතා වස්තුව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
- අධික පරිභෝජනයෙන් වැළකී සරල දිවි පෙවෙතකට හුරු වේ.
- සම්පත් මනාලෙස කළමනාකරණය කර ගැනීමට මව්පියන්ට සහාය වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

අංගුත්තර නිකායේ කුල සූත්‍රයට අනුව හා ජීවක කථා වස්තුවේ සාකේත නුවර සිටුදේවියගේ කථා වස්තුව ඇසුරු කොට සම්පත් පරිහරණයේ වැදගත්කම පැහැදිලි කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ගැටුම්වලින් තොර ව, සහයෝගයෙන්, සම්පත් බෙදාගෙන ජීවත්වීම වැදගත් වන බව
  - සම්පත් තනි ව පරිභෝජනය නොකොට බෙදාගෙන පරිභෝජනය කිරීම වඩාත් ඵලදායක බව
  - පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම වැදගත් බව

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පවුලක හෝ ආයතනයක හෝ දියුණුව බිඳ වැටීමට අදාළව කරුණු හතරක් කුල සූත්‍රයේ සඳහන් බව

    i. විනාශ වූ දේ වෙනම ම අලුතෙන් නොසෙවීම

    ii. දිරා ගිය දේ අලුත්වැඩියා නොකිරීම

    iii. අසීමිත පරිභෝජනය

    iv. චරිතවත් නොවන කාන්තාවක හෝ පුරුෂයකු හෝ ප්‍රධානත්වයට පත්කිරීම

• සම්පත් යනු දෛනික ජීවිතයේ අපගේ විවිධ අවශ්‍යතා සපුරාලන දේවල් බව
• ජීවක කතා වස්තුවේ සාකේත නුවර සිටු දේවිය අරපිරිමැස්මෙන් කටයුතු කළ බව
• සිටු දේවිය සම්පත්වල වටිනාකම කුඩා කල සිට ම දැන තිබූ බව
• ලෝභකම හා සම්පත් අරපරෙස්සම අතර වෙනසක් ඇති බව
• නිවසේ හා පොදු ස්ථානවල සම්පත් අරපරෙස්සමෙන් භාවිත කළ යුතු බව
• පරිහරණය කළ සම්පත් නැවත නිසි පරිදි ස්ථානගත කළ යුතු බව
• පුද්ගලයා දියුණුවීමට නම් තමා තුළ මනා සම්පත් කළමනාකරණයක් පවත්වා ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. නිවසේ දියුණුවට කුල සූත්‍රයේ ඉගැන්වෙන කරුණු භාවිතයට ගන්නා ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. නිවසේ භාවිත වන සම්පත් කිහිපයක් නම් කොට ඒවා අරපරිස්සමින් පරිහරණය කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. පාසලක ඇති සම්පත් කිහිපයක් නම් කොට ඒවා සාමූහික ව පරිහරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. දෙමාපියන් සරල ජීවිතයට පුරුදු ව එය ඇගයීමට ලක් කරන්න.
2. නිවසේ සම්පත් නිසි පරිදි සැලසුම් කර ඒවා පවත්වාගෙන යාම පිළිබඳ දරුවාගේ තරමට වගකීම දරුවාට පවරන්න.
3. ඉතිරි කිරීමට හුරු කරවන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 6.9.2** : සම්පත් පරිභෝජනයේ දී දැඩි ලෝභය හානිකර බව පිළිගෙන ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- දැඩි ලෝභය පසු තැවීමට හේතුවන ආකාරය විස්තර කරයි.
- සම්පත් රැක ගැනීම අපගේ වගකීමක් බව පිළිගනියි.
- "නිවැරදි ව සම්පත් පරිහරණය කරමු." යන මාතෘකාව යටතේ නිර්මාණ ඉදිරිපත් කරයි.
- උපයන සම්පත් සැලසුම් සහගත ව පරිහරණය කරයි.
- කෘතගුණ සැලකීමට හුරු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ස්වර්ණහංස ජාතකය පාදක කර ගනිමින් සැලසුම් සහගත ව සම්පත් පරිහරණයට මගපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සුදුසු පාඩම් ප්‍රවේශයක් ඔස්සේ පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ලද දෙයින් සතුටු වීම ඉතා උසස් ගතියක් බව
  - දැඩි ලෝභයෙන් තොර ව කටයුතු කිරීමට සිත සකස් කර ගත යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ස්වර්ණහංස ජාතකයෙන් දැඩි ලෝභයේ ආදීනව පැවසෙන බව
  - මෙම කථාවෙන් වර්තමානයට ද ආදර්ශ රැසක් ලැබිය හැකි බව
  - දැඩි ලෝභය පසුතැවීමට හේතු වන බව
  - දැඩි ලෝභය පිරිහීමට හා විනාශයට හේතු වන බවට වත්මන් සමාජයේ නිදසුන් රැසක් ඉදිරිපත් කළ හැකි බව
  - දැඩි ලෝභයෙන් තොර ව අරපිරිමැස්මෙන් සම්පත් පරිහරණය කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. දැඩි ලෝභය නිසා සිදු වූ හානියක් දැක්වෙන වෙනත් කතා පුවතක් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. ස්වර්ණ හංස ජාතක කතා පුවත නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. දැඩි ලෝභයෙන් තොර ව කටයුතු කිරීමෙන් සැනසීම සලසා ගත හැකි බව පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

මූලික අවශ්‍යතා හිඟ අයෙකුට උදව් උපකාර කරන්නට දරුවා පොළඹවන්න. ඒ සඳහා අවශ්‍යම ප්‍රතිපාදන ලබා දී දරුවා සමග එම කාර්යයෙහි යෙදෙන්න.

**නිපුණතාව 10** : නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 6.10.1**: බෞද්ධ ප්‍රතිපදාවේ එන ශ්‍රද්ධාව හා ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ හැඳින සැදැහැවත් ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- ශ්‍රද්ධාවන්තයකු තුළ දකින්නට ලැබෙන ලක්ෂණ පැහැදිලි කරයි.
- බෞද්ධයකු වීමේ මූලික පදනම ශ්‍රද්ධාවෙන් ආරම්භ වන බව පිළිගනියි.
- පාසලේ ආගමික වතාවත්වල දී ශ්‍රද්ධාව ජනනය වන ආකාරය දක්වයි.
- එදිනෙදා ජීවිතයේ දී, ආගමික කටයුතුවල දී ශ්‍රද්ධාවෙන් යුතු ව කටයුතු කරයි.
- තුණුරුවන ඇසුරු කොට ගෙන ජීවිතය සාර්ථක කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශ්‍රද්ධාව පිළිබඳ සරල හැඳින්වීමක් සහ "දස්සන කාමෝ සීලවතං" ගාථාව ඇසුරින් ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පැරණි බෞද්ධ නගරයක පිහිටි විහාරස්ථානයක සිල් සමාදන් වූ පුද්ගලයකු සිල් සමාදන් වූ දින රාත්‍රියේ නිදා ගැනීමට සූදානම් ව දෙපා කවර දෙසට යොමු කරන්නේ දැයි සිතමින් (සෑම දිශාවකම ආගමික පූජනීය ස්ථාන පිහිටුවා ඇති හෙයින්) නිදි වර්ජිතව සිට අපහසුතාවට පත් වූ ආකාරය දැක්වෙන ප්‍රබන්ධය හෝ ඒ හා සමාන වෙනත් කථා පුවතක් ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - කථාවෙහි සඳහන් කළ පුද්ගලයා තුළ ශ්‍රද්ධාව නිවැරදි ලෙස පිහිටා නැති බව
  - ශ්‍රද්ධාගුණයට පැහැදිලි තේරුමක් ඇති බව
  - බෞද්ධයකු වීමේ මූලික පියවර ශ්‍රද්ධාව බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ශ්‍රද්ධාව නම් තෙරුවන ගුණ කෙරෙහි පැහැදීම බව
  - ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙකක් ඇති බව
  - එය අමූලිකා හා ආකාරවතී ශ්‍රද්ධා වශයෙන් කොටස් කර ඇති බව
  - බෞද්ධයකු තුළ පැවතිය යුත්තේ ආකාරවතී ශ්‍රද්ධාව බව

- "දස්සන කාමෝ සීලවතං ..." යන ගාථාව ඇසුරෙන් සැදැහැවතකුගේ ලක්ෂණ 3ක් පැහැදිලි වන බව
- ආකාරවතී ශ්‍රද්ධාවෙන් යුතු ව ආගමික වතාවත්හි යෙදිය යුතු බව
- පුණ්‍ය කර්මයන්ට යොමු වන්නේ ශ්‍රද්ධාවන්තයා බව
- ශ්‍රද්ධාව ජනනය වන ආකාරයේ ශාසනික වචන භාවිත කළ යුතු බව
- ශ්‍රද්ධාවන්තයකු වීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කරගත හැකි බව
- සිල්වතුන් ඇසුරු කිරීමට, බණ ඇසීමට, පරිත්‍යාගශීලී වීමට කුඩා කල සිට ම හුරු විය යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ශ්‍රද්ධාව යනු කුමක්දැයි හඳුන්වා "දස්සන කාමෝ සීලවතං ..." යන ගාථාවේ දැක්වෙන ශ්‍රද්ධාවන්තයකුගේ ලක්ෂණ පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ශ්‍රද්ධාව ජනනය වන ආකාරයට පාසලේ ආගමික කටයුතු සංවිධානය කරන ආකාරය ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. ශ්‍රද්ධාවන්තයකු වීමෙන් තමාට සිදු වන යහපත පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

1. තෙරුවන වන්දනාවේ දී පූජා කටයුතුවල දී දෙමාපියන්, දරුවන් සමග ශ්‍රද්ධාව උපදින ආකාරයට කටයුතු කරන්න.
2. වසරකට එක් දිනක් හෝ දරුවා සමග පොහොය සිල් සමාදන් ව ගත කරන්න.
3. ශ්‍රද්ධා ජනනය වන ගී සින්දු ආදිය ශ්‍රවණයට අවස්ථාව සලසන්න.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත්ව ලබාගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතු ව ඇත. බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් තුළින් ප්‍රබෝධාත්මක, සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම්ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත්වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහිදී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරුභවතාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු ය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරුභවතා සමත් විය යුතු ය.

බුද්ධ ධර්මය විෂය මගින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහි දී ධර්මයට අනුගත ව ජීවත්වීමේ අවශ්‍යතාව ප්‍රකටව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමෝපායයන් කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නිවසේ ආගමික වත් පිළිවෙත් හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරීව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදී ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට  පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස රෝහල් ආදියේ උපස්ථාන කටයුතු සහ ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.
- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදී ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත  අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කරගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට  පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

### පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

1. සෑම පුර පසළොස්වක පෝය දින හෝ එම පෝයට පෙර දින හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවලදී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මගින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදී ක්‍රියාකාරකම් මගින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපිය දැනුම්වත් කිරීමෙන් තුළින් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙ හි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සෑම පාඩමක දී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ තක්සේරු කිරීමට/ඇගයීමට විෂය භාර ගුරු භවතා උනන්දුවීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
   - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
   - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
   - ප්‍රදර්ශන, විවාද සාකච්ඡා මණ්ඩල, සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
   - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
   - ස්වභාව අධ්‍යයන දින පොත්, හොඳ වැඩ පොත්, ප්‍රායෝගික පරීක්ෂණ

**විවිධ සහය**

**කාර්යාලීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය

ගාමිණී රෝහණ විමලසේන මහතා, ජාතික අධ්‍යාපන ආයතනය